2025.02.07 ලංකාදීප -

# මාසයක් ජීවත්වෙන්න 16,191 ක් ඕනෑ

- දෙසැම්බර් මස අගය වැඩිවේ
- හතරදෙනකුගෙන් යුත් පවුලකට මාසයක් ජීවත්වීමට රුපියල් 64,764ක්

**යොහාන් හාසුර**

මෙරට වැසියකුට අවම සිය මූලික අවශ්‍යතා සපුරාගැනීම සඳහා මාසයක් තුළ අවශ්‍ය කෙරෙන මුදල හෙවත් දරිද්‍රතා රේඛා අගය පසුගිය 2024 දෙසැම්බර් මාසයේදී රුපියල් 16,191 ක් බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

ඒ අනුව දරිද්‍රතා රේඛා අගය තව දුරටත් ඉහළ ගොස් ඇති බව එම දෙපාර්තමේන්තුව පවසයි.

මෙම නව අගය අනුව සිව්දෙනකුගෙන් යුත් පවුලකට මාසයක් සඳහා අවම අවශ්‍යතා සපුරා ගැනීමට රුපියල් 64,764 ක මුදලක් අවශ්‍ය බවද එම දෙපාර්තමේන්තුව කීය. පසුගිය 2024 වසරේ නොවැම්බර් මාසයේදී එම අගය රුපියල් 16,017 ක්ව තිබූ බවත් එම වසරේ ඔක්තෝබර් මාසයේදී එම අගය රුපියල් 15,994 ක්ව සටහන් වූ බවත් එම දෙපාර්තමේන්තුව පවසයි.